# 496 ඉවසිල්ලක් නැතිව

ඉවසිල්ලක් නැතිව දියට ඇදෙන මුවා සේ
මගේ පනද ඉවසුම් නැත ඔබ වෙත සමිඳේ
කෙදිනද ඔබ ඉදිරියේ මා ඔබව දකින්නේ
මගේ සිතද පිපාසයෙන් තැවෙයි දෙවිඳුනේ

කඳුලයි මගේ දිවා රෑයේ ආහර වන්නේ
ඔබේ දෙවිඳු කොහිදයි යනු නිතර ඇසෙන්නේ

සමිඳු නිවස වෙත ගිය හැටි ජය ගොස මැන්දේ
සිහිවන විට තුති බැති ගී හද තුළ රැව් දේ

මගේ සිත ඇයි ඔබ සන්සුන් ව නොයින්නේ
මා ගැලවුම සමිඳුන් ඔබ අදහා ගන්නේ

මා ශක්තිය වන සමිඳුට මා අමතන්නේ
මා අමතක වූයේ ඇයි තතු විමසන්නේ

සතුරාගෙන් පිඩා විඳ වැලපෙනු ඇයි මා
ඔබේ දෙවිඳු කොහිදයි යනු නැවතත් අසනා

සමිඳුන් වෙත විස්වාසය මා තුළ වන්නේ
මෙමා තවම සමිඳුන් හට ගීත ගයන්නේ